**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල- 2012**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

2012 දෙසැම්බර් 31 දිනට ආපසු තැන්පතු ගිණුමේ ශේෂය වූ රු. 17,136,884 ක මුදල සඳහා කාලවිශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 47,599,048 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.57,693,497 ක් වූයෙන්,මෙහෙයුම් ප්‍රතිඵලවල රු.10,094,449 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉන්ධන වැය ඉකුත් වර්ෂයට වඩා රු.15,704,110 කින් වැඩිවීම එම අතිරික්තය අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

රේගු බදු වංචාවන්, නීතිවිරෝධි ආනයනයන් හා ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කිරීම් වැනි නීතිවිරෝධි ක්‍රියා රේගු නිලධාරීන් විසින් අනාවරණය කර ගන්නා අවස්ථාවලදී අය කරනු ලබන රජයේ බදු ආදායම්,පනවන දණ්ඩන මුදල්, රාජසන්තක කළ මුදල් හා රාජසන්තක භාණ්ඩ විකිණීමෙන් ලද මුදල් යනාදියෙන් සියයට 50 ක කොටසක් නිලධාරීන් හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබා දීම සඳහා මෙම අරමුදලට බැර කරනු ලැබේ.

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සහ ඉකුත් වර්ෂ හයකට අදාලව අරමුදලේ ආදායම් , වියදම් හා ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු පහත දක්වා ඇත.

| වර්ෂය | ආදායම | වියදම | | | | මුළු වියදම | අතිරික්තය/ (ඌනතාව) |
|---|---|---|---|---|---|---|---|
| | | නිලධාරීන්ට ගෙවීම | ඔත්තුකරුවන්ට ගෙවීම | රඳවා ගැනීමේ බදු/දේශීය ආදායම් දෙපා. | අනෙකුත් | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු | රු. |
| 2006 | 594,567,776 | 446,300,470 | 44,183,900 | 6,443,292 | 64,578,911 | 561,506,573 | 33,061,203 |
| 2007 | 1,171,679,881 | 810,441,327 | 72,757,307 | 105,428,768 | 111,382,303 | 1,100,009,705 | 71,670,176 |
| 2008 | 895,773,758 | 678,463,260 | 55,144,035 | 8,693,891 | 119,792,064 | 862,093,250 | 33,680,508 |
| 2009 | 968,064,233 | 716,618,818 | 84,506,905 | 9,132,859 | 113,226,650 | 923,485,232 | 44,579,001 |
| 2010 | 902,474,770 | 687,504,664 | 37,556,075 | 9,328,789 | 102,357,464 | 836,746,992 | 65,727,778 |
| 2011 | 873,979,003 | 574,047,509 | 106,080,370 | 33,927,845 | 102,229,782 | 816,285,506 | 57,693,497 |
| 2012 | 973,210,594 | 694,361,096 | 128,208,276 | 42,779,776 | 60,262,398 | 925,611,546 | 47,599,048 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ රේගු නිලධාරින්ගේ ත්‍යාග අරමුදලේ ආදායම රු. 99,231,591 කින් හෙවත් සියයට 11 කින් වැඩිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ත්‍යාග ලෙස නිලධාරින්ට රු. 694,361,096 ක් ගෙවා තිබුණු අතර ඉකුත් වර්ෂයේදී එය රු.574,047,509 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී නිලධාරින්ට කල ගෙවීම රු.120,313,587 කින් හෙවත් සියයට 21 කින් වැඩි වී තිබුණි. එසේම 2012 වර්ෂය වෙනුවෙන් ගිණුම් අංශයට ලැබී තිබුණත් 2012 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවා නොතිබුණු රු.230,762,533 ක් වූ ත්‍යාග ලැයිස්තු 60 ක් පැවති අතර ප්‍රතිපත්ති සැලසුම් අංශයේ සංචිත ගෙවීම්වලට අදාල රු.1,606,592ක ලැයිස්තුවක් ද විය.

(ඇ) රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්ති ප්‍රකාරව නිකුත්කර ඇති දෙපාර්තමේන්තු නියෝග අංක 118 මගින් නිලධාරින් හා ඔත්තුකරුවන් අතර ත්‍යාග මුදල් බෙදා හැරීමේ යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබුණු අතර, 2010,2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 725 ක් රු.මිලියන 680 ක් හා රු.මිලියන 822 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,227 ක් නිලධාරීන් හා ඔක්තුකරුවන් අතර බෙදා හැර තිබුණි. මින් රු.මිලියන 1,962 ක් හෙවත් සියයට 88 ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණු ත්‍යාග මුදල් වූ අතර ලබාදිය හැකි ත්‍යාග මුදල් පිළිබඳ උපරිම සීමා පනවා නොමැති බවද නිරීක්ෂණය විය. ඒ අනුව එක් නිලධාරියෙකු සඳහා එක් වරකදී රු. මිලියන 90 ක්ද ඉක්මවා ත්‍යාග ලෙස ගෙවූ අවස්ථා පැවතුණි.

(ඈ) **විෂ මත්ද්‍රව්‍ය ගිණුම**

-------------------------

නිශ්චිත නිර්ණායක හඳුනාගැනීමකින් තොරව ත්‍යාග අරමුදලින් කොටසක් විෂ මත්ද්‍රව්‍ය අරමුදල සඳහා වෙන් කරනු ලබන අතර 2012 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.57,990,812 ක් විය. සමාලෝචිත වර්ෂයේදී මෙම අරමුදලින් රු. 1,795,000 ක වියදමක් කර තිබුණි.

(ඉ) **ආපසු තැන්පත් ත්‍යාග ගිණුම**

මෙම ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.17,136,884 ක් විය. විටින්විට දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ත්‍යාග ලැයිස්තුවලින් අදාළ ත්‍යාග මුදල් ලබා නොගත් නිලධාරින්ගේ මුදල් මෙම ගිණුමට බැර කරනු ලැබේ. එසේම, එම නිලධාරින්ට අදාල මුදල් නැවත ඉල්ලීම කරන අවස්ථාවේදී අදාල ගෙවීම් මෙම ගිණුමට හර කරනු ලැබේ. කෙසේ වුවද, ආපසු තැන්පත් ත්‍යාග අරමුදල් ගිණුමේ ශේෂය වර්ෂ ගණනාවක සිට සමුච්චිත වෙමින් ඉදිරියට එන ශේෂයක් ලෙස නිරීක්ෂණය වූඅතර මෙම ඉදිරියට ගෙන එන ලද ආපසු තැන්පත් ත්‍යාග මුදල්වලට අදාල දීර්ඝ කාලීන නොපියවුම් සඳහා විධිමත් පියවරක් ගෙන නොමැති බවද නිරීක්ෂණය විය.

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් සඳහා උපයන විට ගෙවීම් බදු අඩු කිරීමේදී ශ්‍රීලංකා රේගුව විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ උපදෙස් සැලකිල්ලට ගෙන නොතිබුණි. නිලධාරීන්ට ගෙවන ත්‍යාග මුදල් එක් වර ගෙවීමක් ලෙස සලකා කටයුතු කර තිබුණ නමුත් අවස්ථා කිහිපයකදී ගෙවනු ලබන ගෙවීම් සමුච්චිත කර අවසාන වශයෙන් අයකර ගත යුතු බදු ගණනය කිරීමක් සිදු කර නොතිබුණි. විවිධ අවස්ථාවල ගෙවන ත්‍යාග මුදල් සඳහා වෙන වෙනම උපයන විට බදු ගණනය කර එයට අදාල කොටස පමණක් අය කිරීම හේතුවෙන් විශාල වශයෙන් රජයට ලැබිය යුතු බදු ආදායමක් අහිමි වී තිබුණි. විවිධ දීමනා ගණනාවක් ලබන රේගු නිලධාරින්ගෙන් රජයට අය විය යුතු බදු මුදල් නිවැරදිව ගණනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යොදා නොතිබීම මතභේදයට තුඩුදෙන කරුණකි. ත්‍යාග ගෙවීම් සම්බන්ධයෙන් විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව නිලධාරීන් 234 දෙනෙකුගෙන් පමණක් 2012/2013 බදු වර්ෂය තුළදී, එසේ අඩුවෙන් අයකර තිබුණු උපයන විට ගෙවීම් බදු ප්‍රමාණය දළ වශයෙන් රු.4,823,846 ක් විය.

(ආ) 1988 අංක 83 දරන රේගු (සංශෝධිත) පනතේ 153 (2) වගන්තිය අනුව දණ්ඩන ආදායමින් වැයකල යුතු සියළු වියදම් අඩුකල පසු ඉතිරි මුදලින් සියයට 50 ක් ත්‍යාග අරමුදලට වෙන්කර නිලධාරින්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලෙස බෙදා දීමට හැකි වන පරිදි රෙගුලාසි පනවා තිබුණි. ඒ අනුව විමර්ශන කටයුතු සිදුකරන සියළුම නිලධාරින්ට එම කාලය සඳහා අරමුදලින් ගෙවා තිබුණු අතිකාල මුදල්, දණ්ඩන ආදායමින් අඩුකල යුතු වුවද එසේ නොකර රේගු අතිකාල අරමුදලේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එසේම විමර්ශන කටයුතු සඳහා වූ අතිකාල පිරිවැය පිළිබඳ වාර්තා වෙනම පවත්වා නොතිබුනු හෙයින් විමර්ශන කටයුතු සඳහා දරා තිබුණු අතිකාල පිරිවැය ගණනය කළ නොහැකි විය.

(ඇ) දැනට පවත්නා රේගු ත්‍යාග යෝජනා ක්‍රමය අනුව නිලධාරින්ට ත්‍යාග ගෙවනුයේ රේගු බදු වංචාවල නිරත වන පාර්ශවයන්ට පනවන දණ්ඩන මුදලින් පමණක් නොව, එම පාර්ශවයන්ගෙන් රජයට අයවිය යුතු බදුමුදලින් ද සියයට පනහක (50%) කොටසක් ඇතුළත් වන පරිදි වීම නිසා රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා සිදු කල යුතු දායකත්වය පිළිබඳව වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) විශේෂ රේගු විමර්ශනයකින් තොරව විවිධ පාර්ශවයන්ගෙන් අයකරගෙන ඇති බදු ආදායම් හා දණ්ඩන මුදල් වලින්ද රේගු නිලධාරින්ට ත්‍යාග ගෙවීම් සිදු කර ඇති අවස්ථා බහුලව පවතින බව විගණනයේදී වරින් වර පෙන්වා දී තිබුණි. උදාහරණ ලෙස Carnet ව්‍යාපෘතිය යටතේ ආනයනය කර තිබූ වාහන 02 ක් නැවත අපනයනය කිරීම වෙනුවට එම වාහනවල අයිතිය ආනයනය කළ පාර්ශවයන්ට පැවරීමේදී අයකරගෙනතිබුණු රු.7,929,693 ක වටිනාකමින් රු. 3,964,847 ක මුදලක් නිලධාරින්ට ත්‍යාග ලෙස ගෙවා තිබුණි.

(ඉ) නිශ්චිත නිර්ණායක හඳුනාගැනීමකින් තොරව ත්‍යාග අරමුදලින් කොටසක් ඉන්ධන අරමුදල සඳහා වෙන්කරනු ලබන අතර සමාලෝචිත හා ඉකුත් වර්ෂයන්හි 2012 දෙසැම්බර් 31 දිනට මෙම ගිණුමේ ශේෂය පිළිවෙලින් රු.182,653,578 ක් හා රු.191,881,945 ක් විය. එසේම ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේද රේගු දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ ඉන්ධන වියදම් සඳහා ලැබී තිබුණු රු.25,000,000ක් වූ ප්‍රතිපාදනයන්ට අමතරව මෙම අරමුදල මගින්ද රු.18,577,016 ක්

ඉන්ධන සඳහා වැයකර තිබුණි. මේ සඳහා ලබාගත් විධිමත් අනුමැතියක් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. තවද, සමලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු, වැය ශීර්ෂය යටතේ ඉන්ධන වියදම් සඳහා ලබා දී තිබුණු රු.25,000,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.8,019,349 ක් නිලධාරින්ට දීමනා ගෙවීම සඳහා වූ වැය විෂයට මාරුකර තිබියදී දෙපාර්තමේන්තු ඉන්ධන වියදම් සඳහා මෙසේ විශාල මුදලක් ඉන්ධන අරමුදලින් දැරීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) ගිණුම්කරණය.

(ආ) ත්‍යාග මුදල් බෙදා දීම හා වියදම් පාලනය